**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**සත්වෝද්‍යාන** සංවර්ධන හා සුභසාධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය
------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 01 හි 53 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ආදායම් හා වියදම් ගිණුමේ පසුගිය වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යා හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 53 ඡේදය ප්‍රකාරව ගිණුම් පිළියෙළ කිරීමට කටයුතු කල අතර පසුගිය වර්ෂයේ විගණකාධිපති වාර්තාවන්හී පෙන්වා දුන් පරිදි ආදායම් ප්‍රකාශය ආදායම් වියදම් ගිණුමක් ආකාරයෙන් පිළියෙල කිරීමේදී පසුගිය වර්ෂයේ සංඛ්‍යාත්මක තොරතුරු හෙළිදරව් කිරීමට නොහැකි වී ඇති අතර 2019 වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 53 ඡේදය ප්‍රකාරව කටයතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රමිත අංක 02 හි පරිශිෂ්ඨයේ දක්වා ඇති පරිදි මුදල් හා මුදල් සමානදෑවල ආරම්භක හා අවසන් ශේෂ අතර වෙනස මුදල් ප්‍රවාහ ප්‍රකාශ තුළ පැහැදිලිව පෙන්නුම් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ශුද්ධ මුදල් ප්‍රවාහය පමණක් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව සතු සංවර්ධන අරමුදලෙහි ශේෂය වර්ෂය අවසනයේ මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරිම සිදුකරනු ලබන බැවින් ඊට පසු වර්ෂයේ ආරම්භක ශේෂය ශුන්‍ය ලෙස සලකනු ලබයි. එබැවින් ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස අවසාන ශේෂයම වන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල එලෙස සටහන් කිරිම සිදුකරන ලද බව කාරුණිකව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 පරිශිෂ්ඨය පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රමිත අංක 07 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් නමුත් ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.72,941,488 ක ස්ථාවර වත්කම්වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය නොවන බැවින් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සංවර්ධන අරමුදලට අදාළ වත්කම් සියල්ලම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙහි එකඟතාවය මත රජයේ අරමුදල වෙත 2019 වර්ෂයේදී මාරු කිරීමට සැලසුම් කර ඇති අතර එහිදී ක්ෂය කිරීම් අවසන් වී ඇති සංවර්ධන අරමුදලට අදාළ වාහන නැවත අගය කිරීමට ලක් කර ඇත. එසේම ගොඩනැඟිලි හා ඉදිකිරීම් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති තක්සේරු වාර්තාවේ අගයන් පදනම් කර ගැනිමට නියමිය. යන්ත්‍ර හා යන්ත්‍රොපකරණ හා ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ නැවත අගය කිරිම සඳහා මේ වනවිට කමිටු පත් කිරිම සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලෙස දැක්විය යුතු රු.1,442,352,853 ක් කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | සංවර්ධන අරමුදලට අදාළ ස්ථාවර වත්කම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත 2019 වර්ෂයේදී රජයේ අරමුදල වෙත මාරු කිරීමට කටයුතු කරමින් පවතින බැවින් එම මාරු කිරීම් සිදුකිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ස්ථාවර වත්කම් ලෙස දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවා සපයන ආයතනයක් වශයෙන් සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවෙහි සත්වෝද්‍යාන අරමුදලට අදාළව විකුණුම් පිරිවැයක් තිබිය නොහැකි වුවද, ලාභ හා අලාභ ප්‍රකාශනයක් මගින් විකුණුම් පිරිවැය රු.302,521,708 ක් වශයෙන් ගණනය කර ආදායම් හා වියදම් ගිණුමට ගලපා තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙළ කිරිමේදී සත්ව ආහාර, සත්ව ඖෂධ හා ප්‍රවේශපත්‍ර මුද්‍රණ තොග විකුණුම් පිරිවැයට ගැලපීම නිවැරදි කර, භාවිතා කරන ලද තොගවල වටිනාකම පමණක් අයහාර වියදම් ලෙස ඇතුලත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | එම තොගවල භාවිතා කළ ප්‍රමාණයන්ගේ වටිනාකම පමණක් අයහාර වියදම් ලෙස ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | සමරුහලේ ඌනතාවය රු.35,357 ක් වශයෙන් ගණනය කර තිබුණ ද එය අරමුදලේ ආදායම් හා වියදම් ගිණුමට ගැලපීමේදී රු.277,821 ක ලාභයක් ලෙස දක්වා තිබුණි. | සමරු අලෙවිසැලෙහි ලාභය ගණනය කිරීමේදී සිදුවී ඇති වරද ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙල කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මිලදී ගන්නා ලද දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියේ වරද හේතුවෙන් රු.37,982,155 ක ක්ෂය වෙන්කිරීම් වැඩියෙන් දක්වා තිබුණි. | සංවර්ධන අරමුදල මගින් මිලදී ගන්නා ලද දේපළ පිරියත හා උපකරණ යන සියලු වත්කම් 2019 වර්ෂයේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත රජයේ අරමුදල වෙත මාරු කිරීමට අපේක්ෂිත බැවින් එම මාරු කිරීම් සිදුකිරිමේදී වත්කම් මිලදී ගත් දිනය පදනම් කර ගෙන ක්ෂය ගැලපීම සිදුකොට අදාළ ගිණුම් සටහන් තැබීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදි ක්ෂය ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. | සංවර්ධන අරමුදලට අදාළ ස්ථාවර වත්කම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය මත 2019 වර්ෂයේදී රජයේ අරමුදල වෙත මාරු කිරීමට කටයුතු කරමින් පවතින බැවින් මෙම වර්ෂය අවසාන වන විට ස්ථාවර වත්කම් ලේඛණය සකස් කිරිම සිදුකර අවසන් කිරීමට බලාපොරොත්තු වන බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.448,955,427 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.507,779,651 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.58,824,224 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සත්ත්ව ආහාර මිලදී ගැනීමේ වියදම හා වෙනත් වියදම් රු. 48,375,556 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ක්ෂය රෝගය වැළදුණු අලින්ට අවශ්‍ය සමහරක් ඖෂධ ලබා ගැනීමේ හිඟතාවය නිසා රෝගී අලින්ට බෙහෙත් ලබාදීමට නොහැකි වී තිබුණි. | සත්වෝද්‍යානයේ ක්ෂය රෝගය වැළදුණු අලි ඇතුන් සඳහා ප්‍රතිකාර කිරීමට යොදා ගනු ලබන ඖෂධ වර්ගය ශ්‍රී ලංකාවට ආනයනය කිරීම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඖෂධ සැපයීම් ඒකකය මඟින් සිදුකරනු ලබයි. ඔවුන් විසින් ආනයනය කරනු ලබන ඖෂධ රාජ්‍ය ඖෂධ සංස්ථාව මඟින් බෙදාහැරීම සිදුකරනු ලබයි. එහිදී සීමිත ඖෂධ ප්‍රමාණයක් ආනයනය කිරීම සිදුකරනු ලබන අතර මෙම ඖෂධ වෙනත් කිසිම ආයතනයක් විසින් ආනයනය කිරීම සිදු නොකිරීම මත අලි ඇතුන් සඳහා අවශ්‍ය බෙහෙත් ලබා ගැනීමේ නොහැකි තත්ත්වයක් පැන නැඟී ඇත. මෙම රෝගය වැළදුණු අලි ඇතුන් නාරම්බැද්ද නැමැති විශේෂිත නිරෝධණ ආයතනයේ රඳවා ප්‍රතිකාර කිරීම සිදුකරනු ලබන බැවින් අනෙක් සතුන්ට හා මිනිසුන්ට පැතිරයාමේ අවධානම අවම මට්ටමේ පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟතාවයකින් තොරව ක්‍රමවත්ව ඖෂධ ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 මැයි මස සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ඖෂධ ගබඩාවේ සිදුකළ භෞතික පරීක්ෂාවේදී වටිනාකම රු.393,388 ක් වූ කල්ඉකුත් වී තිබූ ඖෂධ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ඖෂධ ගබඩාවේ පවතින කල් ඉකුත් වූ ඖෂධ අනෙකුත් බෙහෙත් වලින් වෙන් කර ගබඩා ගත කර ඇති අතර ඉදිරියේදී මේවා විධිමත් අනුමැතියක් ලබා ගෙන අපහරණය කිරීමට නියමිත බව කාරුණිකව දන්වා සිටිමි. | කල් ඉකුත් වූ ඖෂධ නිසි පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම් රු.9,584,223 ක් වූ මෝටර් රථ 04 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | දෙහිවල සත්වෝද්‍යානය තුළ පවතින වාහන 04 ක් සම්බන්ධයෙන් මේ වනවිට කමිටුවක් පත්කර අපහරණය කිරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පින්නවල සත්වෝද්‍යානයේ සත්ව රෝහලේ එක්ස්-රේ යන්ත්‍රය 2014 වර්ෂයේ සිට අක්‍රීයව තිබුණ ද 2019 මැයි වන විටත් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | පින්නවල අලි අනාථාගාරයේ පවතින එක්ස්-රේ යන්ත්‍රය 2014 වර්ෂයේ සිට අක්‍රීය පවතින අතර ඒ සම්බන්ධයෙන් අදාළ නියෝජිත ආයතනය ගෙන්වා සිදුකරන ලද පරීක්ෂාවේදී එම එක්ස්-රේ යන්ත්‍රය නැවත අලුත්වැඩියා කර භාවිතයට ගත නොහැකි බව දන්වා සිටින ලදී. එබැවින් නව එක්ස්-රේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2017 වර්ෂයේ දී ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලද නමුත් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද පිරිවිත හා ගැලපෙන ලංසුපත් එහිදී ඉදිරිපත් නොවුනි. නැවත ඒ සඳහා ලංසු කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සත්ව ආහාර මිලදී ගැනීමේදී රු.144,344,129 ක් වූ කොන්ත්‍රාත් වෙනුවෙන් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්දේසි විරහිතව මුදල් බවට පත්කළ හැකි ලංසු සුරක්ෂණ ආයතන ප්‍රධානියාගේ නමට ලබා ගත යුතු වුවද එලෙස සිදුකර නොතිබුණි. | සත්ව ආහාර මිලදී ගැනීමේදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකරන ලද ටෙන්ඩරයේ ලංසු සුරක්ෂණය ලේකම්, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශිය සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබා ගැනීම සිදුව ඇති අතර ඉදිරි ප්‍රසම්පාදනයන්හිදී මෙය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නමින් ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ලංසු සුරක්ෂණ ආයතන ප්‍රධානියාගේ නමට ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි ආයතන 07 කින් එක් ආයතනයක් තෝරා ගැනීමට කරන ලද ඉල්ලීමට, මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව සුදුසු ක්‍රමවේදයකට යටත්ව තෝරාගත යුතු බව දක්වා තිබුණි. එසේ වුව ද ලංසු කැඳවීමකින් තොරව දෙහිවල මත්ස්‍යාගාරය සංවර්ධන කිරීමේ I හා II අදියරයන් වටිනාකම පිළිවෙළින් රු.3,253,715 ක් හා රු.3,025,600 ක් වූ කොන්ත්‍රාත් ඍජුවම රාජ්‍ය සංවර්ධන හා ඉදි කිරීම් සංස්ථාව වෙත ප්‍රදානය කර තිබුණි. ඉදිකිරීම අවසන් නොකිරීම හේතුවෙන් පළමු අදියර යටතේ රු.325,571 ක හා දෙවන අදියර යටතේ රු.302,560 ක ප්‍රමාද ගාස්තු අයකර ගත යුතු වුවත් එසේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2016 අගෝස්තු 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ව්‍යාපෘතිය අදාළ ආයතනවලට වෙන්කර දෙනුයේ කෙසේද යන්න පැහැදිලිව සඳහන් කර නොමැති බැවින් ව්‍යාපෘතියේ ස්වභාවය අනුව එක් එක් ඉදිකිරීම් ආයතනයේ ධාරිතාවයන්, සත්වෝද්‍යානය තුළ පෙර සිදුකර ඇති හා එම අවස්ථාවේ සිදුකරමින් පවතින ව්‍යාපෘතීන් සැලකිල්ලට ගෙන අනුමැතිය ලැබී ඇති ආයතන අතුරින් වඩාත්ම සුදුසු යැයි සැලකෙන ආයතනයට කොන්ත්‍රාත්තු පිරිනැමීම සිදුකර ඇත. ඒ අනුව ඉහත ව්‍යාපෘති රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවට පිරිනමා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. මෙම ව්‍යාපෘතියෙහි සිදුවී ඇති | ආයතන තෝරා ගැනීම ලංසු කැඳවීමකින් සිදු කළ යුතුය. |

ප්‍රමාදයන් සම්බන්ධයෙන් ආයතනය විසින් වරින් වර කාලය දීර්ඝ කර ගැනීම සඳහා ඉල්ලීම් සිදුකර ඇතත් දෙපාර්තමේන්තුව විසින් එම ඉල්ලීම් සඳහා එකඟතාවය ලබා දීම සිදුකර නොමැත. එසේම ව්‍යාපෘතිය අවසන් කරන අවස්ථාවේදී ඉදිරිපත් කරන හෝ අවසාන බිල්පතට හෝ ගෙවීම් කිරීමේදී ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නියමිත බව කාරුණිකව දන්වා සිටිමි. ඉහත ඉදිකිරීම් ආයතනය කාර්යසාධන බැඳුම්කර ලබා දීමෙන් නිදහස් වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන ඇත. එහි පිටපතක් මේ සමඟ අමුණා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.